# කාර්ය භාරය

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන සියලුම මානසික ශාරීරික හිංසන හා විෂමතාවයන් පිළිබඳව ක්‍රියාකිරීම
- දුරකතන ඇමතුම් හරහා ලැබෙන පැමිණිලි වර්ගීකරණය කිරීම,
- පීඩාවට පත් වූ අය වෙනුවෙන් සහන සැළසීමට අදාල ආයතන, නිලධාරීන් වෙත යොමු කිරීම
- පැමිණිලිකරුගේ අවශ්‍යතාවය මත දුරකතන මාර්ගය මගින් අදාල ප්‍රශ්න වලට මාර්ගෝපදේශනය ලබා දීම. මානසික අවශ්‍යතාවය මත නීති උපදෙස් හා මනෝ උපදේශනය ලබා දීම,
- අවශ්‍ය අවස්ථා වලදී සමථකරුවෙකු වශයෙන් ක්‍රියාකිරීම.

**ඔබගේ ගැටළුව විසදීමට අප සූදානම්...**

1938 කාන්තා උපකාරක දුරකතන සේවාවට ලංකාවේ ඕනෑම දුරකතනයකින් සම්බන්ධ වී ඔබගේ ගැටළුව ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

එසේම ඔබගේ ගැටළුව අපගේ ලිපිනයට ලිඛිතව යොමු කල හැකිය. එසේත් නොමැති නම් අප අමාත්‍යාංශයට පැමිණ ඔබගේ ගැටළුව ඉදිරිපත් කර අවශ්‍ය සහනය ලබාගත හැකිය.

**රාජකාරී දිනයන්හි**
**පෙ.ව. 8.30 සිට**
**ප.ව. 5.15 දක්වා**

ජාතික කාන්තා කමිටුව

**ජාතික කාන්තා කමිටුව,**
කාන්තා හා ළමා කටයුතු සහ
වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය
5වන මහල, සෙත්සිරිපාය - IIවන අදියර,
බත්තරමුල්ල.
**දුරකතන**: 0112186320
**ෆැක්ස්**: 0112187288
**විද්‍යුත් තැපෑල**: secncwsl@gmail.com

ජාතික කාන්තා කමිටුව

# අමතන්න නොපමාව කාන්තා හිංසනයට එරෙහිව

කාන්තා උපකාරක දුරකථන සේවාව
பெண்கள் உதவி தொலைபேசிச்சேவை
1938
WOMEN'S HELP LINE

කාන්තා හා ළමා කටයුතු සහ
වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය

# කාන්තා හිංසනය පිටු දකිමු

# 1938

" කාන්තාවන් මුහුණපාන අනේකවිධ අසාධාරණකම්, අයිතිවාසිකම් අහිමි කිරීම්, අතවර මෙන්ම වෙනයම් වූ පීඩාවන් හේතුවෙන් පැන නගින ගැටළු සම්බන්ධයෙන් සහන සැලසීම අරමුණු කොට ගෙන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ජාතික කාන්තා කමිටුව විසින් මහජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන කාන්තා උපකාරක දුරකතන සේවයයි."

# ඔබට අපෙන් ...

**ජාතියේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව සමස්ත කාන්තාවන් වෙනුවෙන්ම පෙනී සිටිමින් කටයුතු කරයි.**

1938 කාන්තා උපකාරක දුරකතන සේවාවට ඔබගේ ගැටළු ඉදිරිපත් කිරීමට හැකි අතර ඒ සඳහා කිසිදු මුදලක් අය නොකෙරේ.

1938 කාන්තා උපකාරක දුරකතන සේවය ඇමතීමට ඔබට නොහැකි නම් ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අමාත්‍යාංශය විසින් පිහිටුවා ඇති ළමා හා කාන්තා සංවර්ධන ඒකකයේ පහත සඳහන් නිලධාරීන් හමුවී ඔබගේ ගැටළුව ඉදිරිපත් කළ හැකිය.

- වනිතා සංවර්ධන නිලධාරී
- උපදේශන සහකාර
- සහන සොයුරිය

# 1938

කාන්තා උපකාරක දුරකතන සේවය සඳහා

## යොමු කළ හැකි පැමිණිලි

- ගෘහස්ථ හිංසනය
- පවුල් ආරවුල්
- ලිංගික අතවර
- භාරකාරත්වය
- නඩත්තු හා දික්කසාද
- මානව හිමිකම් කඩවීම්
- අවිවාහක කාන්තාවන්ගේ ගැටළු
- විදේශ රැකියා සම්බන්ධ ගැටළු
- රැකියා අයිතිවාසිකම් කඩ වීම
- ආර්ථික දුෂ්කරතා
- විවිධ

**ආදී ගැටළු සඳහා උපකාර කිරීම අපගේ අපේක්ෂාවයි.**